

**සසර කතරේ අතරමං වූ සියල් සත් වග එතෙර කරනට ඔබේ පියවර සැලෙන තාලෙන් පොළෝ තල පා පොඩි සිඹී**

## ⌘ ගැටුම් නැති ලොවක් වෙත....

– කිරිහෙට්කුලමේ සරණංකර හිමි

බුදුරදුන්ගේ අවවාද – උපදෙස් නොතකා කලහ – විවාද කළ පිරි–සක් නිමිතිකරගෙන සිදු කළ දේශනාවකට අර්ථ විවරණයක් – වෙසක් අමාවක පෝද ධර්ම දේශනාවෙන්. සාමකාමී බුද්ධිමත් සංවාදයෙන් බැහැරව – තමන්ගේ මතයම තහවුරු කිරීම සඳහා සිදු කෙරෙන කලහ විවාද නිසා සිදුවන්නේ විනාශයක් බවය, මෙම දේශනාවෙන් පැහැදිලි කරදී ඇත්තේ. වර්තමාන ජන සමාජයේ බෙහෙවින් දක්නට ලැබෙන මෙම වැරැදි පිළිවෙත; මෙම දම් දෙසු–මෙන් විවේචනයට ලක්කැරේ.

## ⌘ අබිනික්මනේ මහිමය කියාදෙන මුවදෙව්දාව

– නයන තිලක් රත්නායක

ශ්‍රී ලංකාවේ ඉපැරැණි බෞද්ධ සාහිත්‍ය ග්‍රන්ථ පිළිබඳ විමර්ශනයක් වශයෙන් ඉදිරිපත් කැරෙන ලිපි පෙළක දෙවැනි ලිපිය. 'මුවදෙව්දව' නම් වූ ඉපැරැණි සුප්‍රකට කාව්‍ය ග්‍රන්ථයේ ඇතුළත් නිර්මාණ කිහිපයක් ඉදිරිපත් කිරීම මගින් ශ්‍රී ලංකාවේ ඉපැරැණි සාහිත්‍යයට බුදු දහමෙන් ලැබී ඇති ආභාෂය කෙබඳුදැ'යි පෙන්වා දීමට මෙම ලේඛකයා උත්සාහ දරයි.

## ⌘ A wake up call from Kusinara

*-Ven. Dr. P. Gnanarama*

## ⌘ සත් සිත් සනසන බෝ සමිඳුට රන් වැටකින් පූජෝපහාර

– සේනපුර ඩී. නිශ්ශංක

අනුරාධපුර ජයශ්‍රී මහා බෝධීන් වහන්සේට නව රන් වැටක් පූජා–කිරීමේ පූණ්‍යෝත්සවය පිළිබඳ ප්‍රවෘත්ති විශේෂාංගයකි.

## ⌘ ජීවිතය වෙත නුවණැසින් බැල්මක්

'දම්සක් මැදුර' නව විශේෂාංගය යටතේ ජනප්‍රිය ධර්ම දේශක හිමි–නමක් සමග වැදගත් දහම් කරුණක් පිළිබඳ කරන ලද සාකච්ඡා–වකි. බුදුදහමේ දැක්වෙන "දුක්ඛ' සංකල්පය පිළිබඳ ධර්ම විවර–ණයකි.

## ⌘ බ්‍රික්ෆීල්ඩ් බෞද්ධ විහාරය

– එන්. වීරප්පෙරුම

වසර සියයක් පමණ පැරැණි – ආගමික හා සමාජ මෙහෙවර රැසක් ඉටුකැරෙන බෞද්ධ විහාරස්ථානයක් පිළිබඳ තොරතුරු – 'සයුරෙන් එහා' විශේෂාංගයෙන්. මැලේසියාවේ ක්වාලාලම්පූර් හි මෙම විහාරස්ථානය පිහිටා ඇත.